Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2016-05-17 |

පැමිණිලිකාරිය : එම්.ඩී.එම්. චන්දිමා කුමාරි දසනායක මිය.
ඩී 19. නාරන්පිටිගොඩවත්ත.
බෙලිගම්මන. මාවතැල්ල.

වගඋත්තරකරුවන් : සාමාන්‍යාධිකාරී.
ලංකා විදුලිබල මණ්ඩලය.
අංක 50. ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත.
තැ.පෙ. 540. කොළඹ 02.

<u>පැමිණිලි අංකය : HRC/2449/15</u>

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ඇබෑර්තුව පැවතුනු කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට පෙත්සම්කාරිය ඉදිරිපත් වූ බවද. 2015.05.26 වන දින පැවති එකී සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ පසු ඉල්ලා තිබූ සියලු සුදුසුකම් සපුරා ඇතත්. තමාට එකී තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සලකා බලා තනතුර ලබා නොදුන් බවද තමාට වඩා අවම සුදුසුකම් ඇති පුද්ගලයින් හට එම තනතුරු ලබාදී ඇති බවද සඳහන් කර ඇත. ඒ පිළිබඳව කරුණු දක්වා තමා විසින් කල සියලු අභියාචනා නොසලකා හැර ඇති බවද තමා එකී තනතුරට අදාල සියලු සුදුසුකම් සපුරා තිබියදී තමාට වඩා අඩු සුදුසුකම් ලබා ගෙන තිබූ අයදුම්කරුවන්ට එකී ඇබෑර්තු පිරවීමට අවස්ථාව ලබා දීමෙන් තමාට අසාධාරණයක් සිදු කල බවද වගඋත්තරකරුවන් පරිපාලන හා විධායක වශයෙන් ගන්නා ලද තීරණ මත තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවද පැමිණිල්ලෙන් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

2015.08.04 වන දින ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) විසින් වගඋත්තර පාර්ශවය වෙනුවෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඉන් දක්වා ඇත්තේ ලංකා



| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165,කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08. | සභාපති / தவிசாளர் / Chairman: 011-2696470 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470 | ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk |
| දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම් / செயலாளர் / Secretary: 011-2689558 | ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996 | වෙබ් / இணையம் / Web: www.hrcsl.lk |

විදුලිබල මණ්ඩලයේ සියලුම තනතුරු සඳහා බඳවා ගැනීමට විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් පවතින බවද ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගෙන් හා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයෙකුද, ජ්‍යෙෂ්ඨ විධායක තනතුරු සඳහා වෘත්තීය ආයතන නියෝජිතයෙකුද, සහභාගි කරවා ගනිමින් සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති බවද සඳහන් කර ඇත. තවද අයදුම්කරුවන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, වෘත්තියට අදාල අමතර සුදුසුකම් හා බාහිර ක්‍රියාකාරකම් ද වාචික පරීක්ෂණයේදී අවම වශයෙන් 60 කට වඩා ලකුණු ලබා ගතයුතු බවද දක්වා ඇත. පෙත්සම්කාරිය සම්මුඛ පරීක්ෂණයේදී නියමිත ලකුණු ප්‍රමාණය ලබා ගෙන නොමැති බැවින් එකී තනතුර සඳහා ඇයට හිමි අවස්ථාව ලැබී නොමැති බවද සඳහන් කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

2015.09.18 වන දින සිතාසි ප්‍රකාරව දෙපාර්ශවය කැඳවා පරීක්ෂණය සිදු කර ඇති අතර පෙත්සම්කාරිය විසින් කරුණු ඉදිරිපත් කළ පසුව වගඋත්තරකරුවන් ද පෙර එවා ඇති වාර්තාවට අනුව කරුණු ඉදිරිපත් කර ඇත. බඳවා ගැනීමේ පටිපාටිය පරීක්ෂණ අවස්ථාවේදී පරීක්ෂාවට ලක් කර ඇති අතර, මෙම තනතුරට අදාලව ලකුණු ලබා දීමේ ආකාරය පිළිබඳව පහත පරිදි දක්වා ඇත.

| | | |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් සඳහා | ලකුණු | 20 |
| වෙනත් හැකියාවන් සඳහා | ලකුණු | 20 |
| සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ කරන විමසීම සඳහා | ලකුණු | 60 |

ලෙස වේ.

පෙත්සම්කාරිය ලබා ගෙන ඇත්තේ ලකුණු 55 ක් බව අනාවරණය වී ඇති අතර, ලකුණු 60 ක සීමාව යටතේ ලකුණු ලබා ගත් අය 27 දෙනෙකු තෝරා ගෙන ඇති බව පැහැදිලි වී ඇත. වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, මෙම තනතුරු වල ඇති රාජකාරි ස්වභාවය අනුව අධ්‍යාපන සුදුසුකම් වලට දී ඇති ලකුණු ප්‍රමාණය ඉක්මවා වෙනත් හැකියාවන් සහ වාචික පරීක්ෂණය සඳහා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා දෙන බවය.

පෙත්සම්කාරියට සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමේදී අ.පො.ස. (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ගන්නා ලද සුදුසුකම් පිළිබඳව සලකා බලන බවද අතිරේක සුදුසුකම් පිළිබඳ සහතික හා බාහිර ක්‍රියාකාරකම් වලට අදාළ සහතික ද තිබේ නම් ඉදිරිපත් කරන ලෙස දක්වා ඇත. පෙත්සම්කාරිය අ.පො.ස. (සා/පෙළ) සමත්ව ඇති බවද අ.පො.ස. (උ/පෙළ) සමත්ව කැළණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධියක් ද ලබා සිටින අතර, පරමාණු බලශක්ති අධිකාරියේ මාස 6 ක කාලසීමාවක් කළමණාකරන සහකාර ධුරයේ සේවය කළ බවද නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා අවම සුදුසුකම් හැර පවත්නා අධ්‍යාපන සුදුසුකම් සඳහා ලබා දියහැකි උපරිම ලකුණු සීමාවට අනුව ලකුණු ලබාදී ඇති බවද, තනතුරට අදාල නිපුනතාවය සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලන බවදය. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සලකා බැලීම සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දුන් ලැයිස්තුවද සමග තවදුරටත් පෙත්සම්කාරියට සහනයක් ලබාදීමට හැකියාවක් තිබේද යන්න පිළිබඳව සලකා බලා වාර්තා කරන ලෙස දන්වා දන්වා ඇති අතර, 2015.11.24 දිනැති අවසන් පරීක්ෂණ අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දුන් ආකාරය පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමට අපහසු බවද විමර්ශන කටයුත්තක් උදෙසා අදාල ගොනු විමර්ශන අංශයට බාර ගෙන ඇති බවද වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත. පෙත්සම්කාරියට ලකුණු ලබා දුන් ආකාරය පිළිබඳ දැක්වෙන පිටුවේ ජායා පිටපතක් පමණක් ඉදිරිපත් කළ හැකි බවත් ඉදිරි දිනක තවදුරටත් පරීක්ෂණ ලැයිස්තුව ඉදිරිපත් කිරීමට හැකි බවත් වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙන ආකාරය පිළිබඳව වැඩිදුරටත් කරුණු දක්වා ඇති අතර, වෙනත් වැඩිදුර කරුණු ඉදිරිපත් කිරීමක් සිදුව නොමැති බවද නිරීක්ෂණය වේ.

නිරීක්ෂණ :-

පෙත්සම්කාරිය සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමේදී ලකුණු ලබා දුන් ආකාරය පිළිබඳ පරීක්ෂා කර බැලීමට පෙර බඳවා ගැනීමේ පටිපාටියේ ඒ සඳහා පවතින ක්‍රියා පිළිවෙත වෙත අවධානය යොමු කර ඇත. අධ්‍යාපන සුදුසුකම් සඳහා ලබා දෙන ලකුණු 20 සම්බන්ධව වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, මෙම ලකුණු ප්‍රමාණය මුළු ප්‍රතිශතයට අනුව බැලුවහොත් සුළු ප්‍රමාණයක් වුවද කාර්යාල සේවක තනතුර සඳහා එම මට්ටමක අධ්‍යාපන සුදුසුකමක් ප්‍රමාණවත් බවය. වෙනත් සුදුසුකම් සඳහා ලකුණු 20 ක් ද ලබාදී සම්මුඛ පරීක්ෂණයේදී කරනු ලබන විමසීම් වලට ලකුණු 60 ක් ද ලබා දීමට බඳවා ගැනීමේ පටිපාටියේ අවස්ථාව තබා ඇති බව පැහැදිලි වේ. පෙත්සම්කාරිය අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) සමත්ව කැළණිය විශ්ව විද්‍යාලයෙන් උපාධියද සමත්ව ඇති බව නිරීක්ෂණය වී ඇත. නමුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ලකුණු ලබාදීමේදී ඇය කාර්යාල සේවක තනතුරක් සඳහා සුදුසුකම් ලබා නොමැති බවට දක්වා තිබීම මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ලකුණු ලබා ගත් 27 දෙනෙකු තේරී පත්වීමටත් පෙත්සම්කාරිය තේරී පත් නොවීමටත් විශේෂ වූ හේතුවක් තිබේද යන්න වෙත අවධානය යොමු කර ඇත. මේ සම්බන්ධව කරුණු පරීක්ෂා කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී තෝරා පත් කර ගන්නා ලද අයගේ ලකුණු ලැයිස්තුව ඉල්ලා සිටියද 4 දෙනෙකුගේ පමණක් ලකුණු ඇතුළත් පිටුවේ ජායා පිටපතක් පමණක් වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ලබාදීම ගැටලුවක් සහගත වන බවද නිරීක්ෂණය වේ. නමුත් විමර්ශන කටයුත්තක් සඳහා විමර්ශන අංශය වෙත එකී ගොනුව ලබා ගෙන ඇති බව කියා සිටියද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන්

සභාවේ පරීක්ෂණය සඳහා එය ඉදිරිපත් කරන ලෙස ලිඛිතව දන්වා සිටියදීත් ඉදිරිපත් කරවීමට පියවර ගෙන නොමැති බවද නිරීක්ෂණය වේ. එවැනි ලේඛනයක් පරීක්ෂා කර බැලීමට 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල යටතේ ඉල්ලීමක් කර තිබියදී ඒ පිලිබඳ නොසලකා හැර විමර්ශන අංශයෙන් එකී අවශ්‍යතාවය දන්වා එය ලබා ගනිමින් ඉදිරිපත් කිරීමට පියවර නොගෙන සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දුන් අයගේ ලැයිස්තුවේ 27 දෙනෙකුගේ නාම ලේඛනයෙන් 4 දෙනෙකුගේ පමණක් නම් ඇතුලත් පිටුවක විස්තර පමණක් ලබාදී තිබීම පරීක්ෂණයට බාධාවක් බව පෙන්වා දිය යුතුය. එහෙත් එකී පිටුව වෙත අවධානය යොමු කිරීමේදී ලකුණු 20 ක ප්‍රමාණයක් අධ්‍යාපන සුදුසුකම් සඳහා ලබාදීමට හැකියාව ඇති තීරුවේ මුළු ලකුණු ප්‍රමාණය 20 ක් ලෙස ලබා දියහැකි වුවද උපාධියක් දක්වා අධ්‍යාපනය ලබා තිබූ පෙත්සම්කාරිය හට ලකුණු ලබාදී ඇත්තේ ලකුණු 10 ක් පමණක් වන අතර, වෙනත් සුදුසුකම් යටතේද ලකුණු 10 ක් පමණක් ලබාදී ඇත්තේ 20 දක්වා ලබාදීමට හැකියාවක් බඳවා ගැනීමේ පටිපාටිය අනුව තිබියදීය.

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 35 ක් පමණක් ලබාදී ඇති අතර, මුළු ලකුණු ප්‍රමාණය 55 ක් ලෙස ලබාදී ඇත. නමුත් අධ්‍යාපන සුදුසුකම් ලෙස ලකුණු 8 ක් ලබා ගත් අයෙකු හට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 50 ක සීමාවක් ලබාදී ඇති බව පෙනී යන අතර මෙවැනි ආකාරයට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමට ඇති ලකුණු 60 ක ප්‍රමාණය විවිධාකාර වලින් ලබාදී ඇති බවද නිරීක්ෂණය වේ. පෙත්සම්කාරිය තෝරා පත් කර ගන්නා ලද අයගේ තීරුවේ නිර්දේශිත නමක් ලෙස නම් කර තිබුණද පසුව එය තනි පැන් ඉරකින් කපා දමා නිර්දේශ නොවූ බවට සටහන් තබා ඇති බවද එකී ලේඛනය පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වේ. අධ්‍යාපන සුදුසුකම් උපරිම තිබියදී වගඋත්තරකරුවන් ඒ පිලිබඳ නොසලකා හැර ඇති බව නිරීක්ෂණය වේ. පෙත්සම්කාරියට අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 20 න් 10 ක් පමණක් ලබා දුන්නේ කෙසේදැයි කිසිදු පැහැදිලි කිරීමක් නොමැත. ඇයට තව ලකුණු 5 ක් ප්‍රධානය කළේ නම් ඇය පත්වීමට සුදුසුකම් ලබන බව පැහැදිලිය.

නිගමනය :-

ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යාල සේවක තනතුර සඳහා බඳවා ගැනීමට පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා පෙත්සම්කාරිය ඉදිරිපත්ව ඇත්තේ ඉහළ සුදුසුකම් සපුරා තිබියදීය. එනම් අ.පො.ස (සා/පෙළ) සමත්ව අ.පො.ස (උ/පෙළ) ද කලා විෂය ධාරාවන් සඳහා A, B සහ S සාමාර්ථයක් සහිතව ඉහළින්ම සමත්ව සිටින ලද අයෙකු බවද තහවුරු වේ. කැළණිය විශ්ව විද්‍යාලයෙන් උපාධිය කලා විෂය ධාරාව සඳහා ලබා ගනිමින් ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබා ගත් අයෙකු බවද තහවුරු වේ. එසේම පැමිණිලිකාරිය පරමාණු බලශක්ති අධිකාරියේ කළමණාකරන සහකාර ධූරයේ මාස 6 ක සේවා කාලයක් කටයුතු කර ඇති බවද පැහැදිලි වේ. ඒ අනුව

විදුලිබල මණ්ඩලයේ කාර්යාල සේවක තනතුර සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් මෙන්ම බාහිර සුදුසුකම් ද ලබා සිටින බව පෙත්සම්කාරිය පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කර තිබූ විවිධ සහතික බැලීමේදී අනාවරණය වේ. බඳවා ගැනීමේ පටිපාටිය අනුව අ.පො.ස.(සා/පෙළ) මෙම තනතුර සඳහා ප්‍රමාණවත් වුවද වඩාත් ඉහළ සුදුසුකම් ලබා තිබීම නුසුදුසුකමක් වියයුතු නොවේ. සම්මුඛ පරීක්ෂණයේදී ඒ සඳහා ලබා දියහැකි ලකුණු 20 ක ප්‍රමාණයෙන් 10 ක් පමණක් පෙත්සම්කාරිය වෙත ලබාදී තිබීම අනුමත කළ නොහැකි එකකි. ඒ අනුව එම ලකුණු 20 ම ලබා ගැනීමට තරම් සුදුසුකම් ලබා තිබියදී ලකුණු 10 ක් පමණක් ලබාදී තිබීම ප්‍රමාණවත් නොවන්නේ ලකුණු 20 ම ලබා ගැනීමට සපුරා තිබිය යුතු සුදුසුකම වගඋත්තරකරුවන් පෙන්වා දී නැති බැවිනි. වෙනත් සුදුසුකම් සඳහාද ලකුණු 10 ක් පමණක් ලබාදී ඇත්තේ ලකුණු 20 දක්වා වූ උපරිමයක් දක්වා ලබාදීමට හැකියාව තිබියදීය. පරමාණු බලශක්ති අධිකාරියේ මාස 6 ක සේවා කාලයක් ඇය සේවය කර තිබීමෙන් අධ්‍යාපන සුදුසුකම් යන්න උපාධිය දක්වා ලබා තිබීම එම තනතුරට බාධාවක් නොවන බව පෙත්සම්කාරිය කරන ලද සේවය අනුව පෙන්නුම් කෙරේ.

උපාධිය දක්වා අධ්‍යාපන කටයුතු හදාරා තිබීමද, කළමණාකරණ සේවා තනතුරක මාස 6 ක පමණ කාලයක් සේවය කර තිබීමද යන කරුණු දෙකම කාර්යාල සේවක තනතුරට අදාළව විදුලිබල මණ්ඩලයට දී වැඩි සේවාවක් පැමිණිලිකාරියගෙන් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන බව පෙන්වා දෙන අතර, ගුණාත්මක සේවාවක් පෙත්සම්කාරියගෙන් ලබා ගැනීමට හැකියාවක් තිබූ බවද පෙන්වා දිය හැක. ලකුණු ලබාදීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඔවුන්ගේ අභිමතය පරිදි ලකුණු ලබාදීමට ලකුණු 60 ක සීමාවක් තබා ගනිමින් බඳවා ගැනීමේ පටිපාටිය සකසා ගෙන තිබීම ඉදිරියේදී ද ගැටළු ඇති කරවිය හැකි වන්නේ තෝරා ගැනීමේදී ලකුණු 60 ක සීමාවෙන් තෝරා ගැනීමට ද අවස්ථාව සම්මුඛ පරීක්ෂණයේදී ඇති කර ගෙන ඇති ආකාරය නිරීක්ෂණය කිරීමේදීය. එසේම ලකුණු 60 ක් සම්මුඛ පරීක්ෂණය සඳහා ලබා දෙන්නේ කුමන ආකාරයකටද යන්න පහදා පහදා දීමේ භාරය පැවරෙන්නේ වගඋත්තරකාර පාර්ශවයට වුවද, ඔවුන් එම පැහැදිලි කිරීම ලබා දීමට අපොහොසත් වී ඇත. එම නිසා ලකුණු දීමේ පටිපාටිය අත්තනෝමතික බැව් ප්‍රත්‍යක්ෂ වේ. මේ අනුව පෙත්සම්කාරිය හට ලකුණු ලබාදීමේදී ඇයගේ අධ්‍යාපන සුදුසුකම් වෙත නිසි අවධානය යොමු නොකොට ලකුණු ලබාදී ඇත්තේ විනිවිදභාවයකින් තොරව වන බැවින් පරිපාලන හා විධායක ක්‍රියාවක් මගින් සිදු කරනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ ආකාරයක් අනාවරණය වී ඇත. එය 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව යටතේ සාක්ෂාත් කර ඇති සර්ව සාධාරණත්වයේ මූලික අයිතිය උල්ලංඝනය කිරීමක් වන බවට කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පෙත්සම්කාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට හේතුවන පරිදි වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බවට අනාවරණය වී ඇති බැවින් ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යාල සේවක තනතුරකට පෙත්සම්කාරිය පත්කළ යුතු බවට මින් නිර්දේශ කරනු ලැබේ. තවද එකී පත්වීම මුල් පත්වීම් ලබා දුන් දින සිට එනම් 2015.06.25 දින සිට විය යුතු බවටද නිර්දේශ කරනු ලැබේ.

2016-06 - 01 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

Hlldagama
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
17/05/2016

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/bb

**Dr. N. D. Udagama**
**Chairperson**
Human Rights Commission of Sri Lanka